අයවැය චක්‍රලේඛ අංක : 130

මගේ අංක: බීඩී/පීඕබීජ්/පීඑල්එස්/1
ජාතික අයවැය දෙපාර්තමේන්තුව,
මහාභාණ්ඩාගාරය,
කොළඹ 01.

2006.06.28.

අමාත්‍යාංශ ලේකම් වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
දිස්ත්‍රික් ලේකම් වරුන්,

**<u>දේපළ ණය බැංකු මගින් ලබා දීම - ගිණුම් තැබීමේ උපදෙස්</u>**

රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 2005.03.31 දින දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 08/2005 සහ එයට මේ දක්වා කර ඇති සංශෝධන කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවනු ලැබේ. එම චක්‍රලේඛයේ 11.7.2 ඡේදයට අනුව ගිණුම් උපදෙස් පහත දක්වා ඇත.

1. <u>ණය වාරිකය හා එයට අදාල පොලිය පිළිබඳ විස්තර ලබාදීම.</u>

1.1 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 08/2005 හි 11.11.4 ඡේදය අනුව බැංකුව විසින් ණය මුදල නිදහස් කිරීමෙන් පසුව එම චක්‍රලේඛයේ 27 පරිශිෂ්ටයට අනුව අදාල විස්තර බැංකුවෙන් ලබාගත යුතුවේ

1.2 මෙම අයවැය චක්‍රලේඛයේ ඇමුණුම 1 අනුව සෑම වර්ෂයකම ජනවාරි මස 01 දිනට පෙර ණය මුදලේ වාරික, සේවකයාගෙන් අයකරන 4% පොලිය හා රජය විසින් දැරිය යුතු පොලිය පිළිබඳ විස්තර බැංකුවෙන් ලබා ගත යුතුය. එම විස්තර අනුව රජය විසින් ගෙවිය යුතු පොලියේ වෙනස නිවැරදිද යන්න පළමුව පරික්ෂා කළ යුතුවේ. යම් වෙනසක් ඇතොත් එය බැංකුව වෙත දන්වා නිවැරදි කර ගැනීමට පියවර ගත යුතුවේ.

1.3 නිවාස ඉදිකිරීමක දී බැංකුව මගින් ණය නිදහස් කිරීම සිදුවන්නේ අදියර කිහිපයකින් බැවින්, ණය මුදලේ වාරිකය තීරණය කිරීමට පෙර බැංකුව විසින් නිදහස් කළ ණය මුදලේ ශේෂය වෙනුවෙන් පොලිය අයකරනු ලබන විට මෙම චක්‍රලේඛයේ ඇමුණුම 1 ට අනුව නිලධාරියාගෙන් අයවිය යුතු පොලිය හා රජය විසින් දැරිය යුතු පොලිය පැහැදිලිව දැක්වෙන ආකාරයට විස්තර බැංකුවෙන් ලබා ගත යුතුවේ.

1.4 නිවාස ඉදිකිරීමේදී බැංකුව විසින් නිලධාරියාට කොටස් වශයෙන් ණය මුදල නිදහස් කිරීමේදී රජය විසින් දැරිය යුතු පොලියේ වෙනස බැංකුව විසින් නිලධාරියාගේ ණය මුදලින් අඩුකරගෙන ඇත්නම්, එම නිලධාරියා සේවය කරනු ලබන අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු විසින් බැංකුවෙන් ලබාගන්නා තහවුරු කිරීමේ ලිපියක් මත බැංකුව විසින් අඩු කර ගන්නා ලද රජය විසින් දැරිය යුතු පොලියේ වෙනස අදාල නිලධාරියාට ආපසු ගෙවිය යුතුය.

2. <u>ණය වාරික ප්‍රේෂණය කිරීම</u>

2.1 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 8/2005 හි 11.7 වගන්තිය අනුව බැංකුව වෙත මාසිකව වැටුපෙන් අඩුකර ප්‍රේෂණය කරනු ලබන ණය වාරිකය හා රජය විසින් ගෙවනු ලබන පොලිය පිළිබඳ විස්තර මෙම චක්‍රලේඛයේ 2 ඇමුණුම අනුව විය යුතු අතර එහි පිටපතක් අදාල නිලධාරියාටද ලබා දිය යුතුවේ.

2.2 වැටුප් පිළියෙල කරන විට වැටුපෙන් කරනු ලබන අඩුකිරීම් වලදී බැංකුවට ප්‍රේෂණය කළ යුතු ණය වාරික හා පොලිය සහ රජයට අයවිය යුතු ණය වාරික හා පොලිය වෙනුවෙන් ප්‍රමුඛත්වය ලබා දිය යුතුවේ.

2.3 සේවකයකුගේ වැටුපෙන් අය කරනු ලබන බැංකු ණය වාරිකය ඊළඟ මස 05 වන දිනට පෙර බැංකුවට ලැබෙන ආකාරයට චෙක්පත් තැපැල් කළ යුතු අතර, යම් කිසි හේතුවක් නිසා ණය වාරික නියමිත දිනට නොලැබීම නිසා ණය ලබාගත් නිලධාරියාට බැංකුව විසින් ණය වාරික ප්‍රමාදය හේතුවෙන් දඩ මුදල් අය කළ හොත් විෂය භාර නිලධාරියාගේ / වගකිවයුතු නිලධාරීන්ගේ නොසැලකිලිමත් කම නිසා හෝ නිලධාරියාගේ විෂය සීමාව යටතේ බැංකුවට ණය වාරික යැවීම ප්‍රමාද වී ඇත්නම්, එම දඩ මුදල් විෂය භාර නිලධාරියාගේ/ වගකිවයුතු නිලධාරීන්ගේ ඊළඟ මස වැටුපෙන් අයකර බැංකුව වෙත ප්‍රේෂණය කළ යුතුය.

2.4 ණය වාරික ප්‍රේෂණය කළ යුත්තේ සෑම විටම සේවකයා විසින් ණය ලබාගෙන ඇති බැංකු ශාඛාව වෙතමය. එකම ශාඛාවකට ණය වර්ග කිහිපයක් වෙනුවෙන් වාරික කිහිපයක් යවන්නේ නම් බැංකුවට ඒවා පහසුවෙන් හඳුනාගත හැකි ආකාරයට විස්තර සැපයීමට වගබලාගත යුතුය.

3. <u>පොලියේ වෙනස ගිණුම් ගත කිරීම</u>

3.1 බැංකු පොලී අනුපාතය හා සේවකයාගෙන් අය කරන ලද පොලියේ වෙනස රජය විසින් දරණ පොලිය බැවින් එසේ ගෙවනු ලබන පොලිය වැය විෂය අංක ''<u>1006- දේපළ ණය පොලී</u>'' යටතේ ගිණුම් ගත කළ යුතු වේ.

3.2 2006 වර්ෂයේ සිට අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා පලාත් සඟා වෙනුවෙන් අයවැය ඇස්තමේන්තුවල අවශ්‍ය ප්‍රතිපාදන ඇති කිරීමට කටයුතු කර ඇත. යම්කිසි හේතුවක් නිසා ඇස්තමේන්තු වල සලසා ඇති ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන්නේ නම් ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙන් ඒ සඳහා අතිරේක ප්‍රතිපාදන ලබාගැනීමට අවශ්‍ය කටයුතු කල යුතුය.

4. <u>සේවකයකු මියගියේ නම් හෝ පූර්ණ අකර්මණ්‍ය තත්වයකට පත්වේ නම්</u>

4.1 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 8/2005 හි 11.8.8 ජේදය අනුව සේවා කාලය තුල නිලධාරියෙකු මියගියේ නම් හෝ පූර්ණ අකර්මණ්‍යතාවයට පත්වූයේ නම් එවැනි නිලධාරීන් පිළිබඳ ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව අවශ්‍ය කටයුතු සිදු කළ යුතුය.

4.2 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 8/2005 හි 25 පරිශිෂ්ටයට අනුව එම නිලධාරියා වෙනුවෙන් ගෙවිය යුතු මාසික වාරික පිළිබඳ විස්තර ඔහු භාණ්ඩාගාරයට මාරුවීමක් ලැබුවා සේ සලකා භාණ්ඩාගාරයේ, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට දැනුම් දිය යුතුය.

4.3 භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව ණය ඇපකර අරමුදලින්, ගෙවිය යුතු එවැනි ණය වාරික මෙම චක්‍රලේඛයේ අනෙකුත් උපදෙස්වලට අනුකූලව ණය මුදල පියවෙන තෙක් අදාල බැංකු ශාඛාව වෙත මාසික වාරික මගින් ප්‍රේෂණය කරනු ඇත.

5. <u>ණය ඇපකර අරමුදල පවත්වාගෙන යාම</u>

5.1 ණය ඇපකර අරමුදල භාණ්ඩාගාරයේ, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යා යුතුය.

5.2 සියළුම ආයෝජන, ආයෝජනවලට ලැබෙන පොලිය හා මෙම චක්‍රලේඛයේ 4 වැනි ජේදයේ විධිවිධාන අනුව කරනු ලබන ගෙවීම් පිළිබඳ සවිස්තර තොරතුරු භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යා යුතුය.

5.3 සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේදීම ණය ඇපකර අරමුදල වෙනුවෙන් අවසන් ගිණුම් පිළියෙල කළ යුතු වේ.

5.4 මෙම චක්‍රලේඛයේ 4 වන ඡේදයෙන් නියම කරන ලද ගෙවීම් හැර වෙනත් කිසිදු ගෙවීමක් මෙම අරමුදලින් නොගෙවිය යුතුය.

6. <u>පොදු කරුණු</u>

**6.1 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 8/2005 හි 11.4.1 වගන්තිය අනුව ලබා ගෙන ඇති ණයවල වාරික සඳහා වාර්ෂික බැංකු පොලී අනුපාතය 2005 ජනවාරි 01 සිට 2006 ජුලි 31 දක්වා 10% කි. 2006.08.01 සිට නැවත සංශෝධනයක් ඇති කරන තෙක් ණය වාරික සඳහා වාර්ෂික බැංකු පොලී අනුපාතිකය 11% කි. ඒ අනුව රජය විසින් දැරිය යුතු පොලියේ වෙනස නිවැරදිද යන්න පරීක්ෂා කළ යුතුවේ.**

6.2 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 8/2005 හි 11.8.9 වගන්තිය අනුව නිලධාරියකු රාජ්‍ය සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩලයක සේවය සඳහා තාවකාලිකව මුදාහැර ඇති අවස්ථාවක බැංකු වෙත ණය වාරික ප්‍රේෂණය කිරීම පිළිබඳ මෙම චක්‍රලේඛයේ උපදෙස් පිළිබඳව එම ආයතනයේ නිලධාරීන්ව දැනුවත් කිරීමට නිලධාරියා සේවයෙන් මුදා හරින ලද අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව විසින් කටයුතු කළ යුතුය.

7. පළාත් සභා නිලධාරීන් සඳහා රජය විසින් දැරිය යුතු පොලී වියදම් දැරීම.

7.1 මෙම චක්‍රලේඛයේ සියලුම ගිණුම් උපදෙස් පළාත්සභාවන්ද ඒ ආකාරයෙන් අනුගමනය කළ යුතු අතර 2006 වර්ෂයේ සිට රජය විසින් දරණ පොලී වියදම ගිණුම් ගත කිරීම සඳහා අවශ්‍ය වන ප්‍රතිපාදන ඇස්තමේන්තුවල ඇතුලත් කර ඇත.

7.2 පළාත් සභාව යටතේ පාලනය වන පළාත් පාලන ආයතනවල නිලධාරීන් ලබා ගන්නා ණය වෙනුවෙන් දැරිය යුතු, රජය විසින් දරනු ලබන පොලී වියදම එම පළාත් පාලන ආයතනවල අරමුදල්වලින් ගෙවා අදාල පළාත් සභාවලින් ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කළ යුතුවේ.

8. ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් දේපළ ණය බැංකු මඟින් ලබා ගැනීම - ගිණුම් තැබීමේ උපදෙස් සම්බන්ධයෙන් නිකුත් කළ 2005.04.26 වන දින දරණ අයවැය චක්‍රලේඛ අංක 122 හා 2005.06.03 දින දරණ අයවැය චක්‍රලේඛ අංක 122(1) මෙයින් අවලංගු කරනු ලැබේ.

**එම්.බී.ඒකනායක**
අයවැය අධ්‍යක්ෂ ජනරාල්

පිටපත් :

1. ලේකම්, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.
2. සියළුම පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
3. අධ්‍යක්ෂ ජනරාල්, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව
4. අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව
5. විගණකාධිපති.

ඇමුණුම - 01

..........................................................
..........................................................
.......................................(ලිපිනය)

## වාර්ෂික ණය වාරික හා පොලිය අයකිරීම පිළිබඳ විස්තර ලබාදීම

1. නිලධාරියාගේ නම :

2. ණය හිමිකම් අංකය :

3. සේවා ස්ථානයේ ලිපිනය:

4. ණය මුදල :

| වර්ෂය | මාසය | ණය මුදලෙන් අය කරනු ලබන වාරිකය | සේවකයාගෙන් අයකරනු ලබන 4% පොලිය | සේවකයාගෙන් අයකරන මාසික ණය වාරිකය පොලිය සමග | රජය විසින් දැරිය යුතු පොලිය | බැංකුවට ලැබිය යුතු මුළු ණය වාරිකය |
|---|---|---|---|---|---|---|
| | ජනවාරි | | | | | |
| | පෙබරවාරි | | | | | |
| | මාර්තු | | | | | |
| | අප්‍රේල් | | | | | |
| | මැයි | | | | | |
| | ජූනි | | | | | |
| | ජූලි | | | | | |
| | අගෝස්තු | | | | | |
| | සැප්තැම්බර් | | | | | |
| | ඔක්තෝම්බර් | | | | | |
| | නොවැම්බර් | | | | | |
| | දෙසැම්බර් | | | | | |
| එකතුව | රුපියල් | | | | | |

බැංකු කළමනාකරු
බැංකුව/ බැංකු ශාඛාව

දිනය

ඇමුණුම - 02

# ණය වාරික අය කිරීම හා ප්‍රේෂණය කිරීම

මගේ අංකය :-
ඔබේ අංකය :-

කළමණාකරු,

..................................................බැංකුව

...................................................ශාඛාව

මාසය :-................................................ වර්ෂය:-...............................

1. නිලධාරියාගේ නම :-

ණය හිමිකම් අංකය :-

ණය වාරිකය අදාල වන මාසය :-

චෙක්පතේ විස්තරය

චෙක්පත් අංකය :-
බැංකුව හා ශාඛාව :-
චෙක්පත් දිනය :-

| | | | |
|---|---|---|---|
| 2. | ණය වාරිකය | රු: | xxx |
| | ඒ සඳහා නිලධාරියා දරණ පොලිය (4%) | රු: | xxx |
| | රජය දරණ පොලිය | රු: | xxx |
| | ප්‍රේෂණය කළ මුළු ණය මුදල | රු: | xxx |

අමාත්‍යාංශ ලේකම්/
දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙනුවට

දිනය

පිටපත:-
01. ................................................ (නිලධාරියා වෙත)